**ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම - 2018**

-------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විභේදනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් වෙත රුපියල් මිලියන 100 ක පොලී රහිත අත්තිකාරම් මුදලක් 2014 අගෝස්තු 08 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද 2014 අංක 04 දරණ චක්‍රලේඛ යෝජනාවට අනුව ලබා දී ඇත. මෙම මුදල 2015 අගෝස්තු 31 දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් විසින් මුදල් මගින් හෝ ලාභාංශ පියවීමක් මගින් ආපසු ගෙවිය යුතුය. ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සමාගම සංස්ථාගත කිරීමේ දී, එක් පුද්ගලයකුට එක් සාමාන්‍ය කොටස බැගින් වන ප රිදි සහ භාණ්ඩාගාර ලේකම් වෙත එම කොටස් දෙක ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පැවරීමේ අවබෝධය මත එවකට සමාගමේ සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයා ආරම්භක කොටස් හිමියන් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුවද, මෙම අත්තිකාරම් මුදල මේ | රුපියල් මිලියන 100 ක ශ්‍රී ලංකා රක්ෂණ හෝල්ඩින් ලිමිටඩ් විසින් පියවා නොතිබුණද, එකී වගකීම ඔවුන් සිය ශේෂය හරහා තහවුරු කර ඇති අතර ඔවුන්ගේ මෑත ලිපි හුවමාරුව මගින් ඉහත මුදල ගෙවීමට එකඟ වී ඇත. තවද, සමාගමෙහි මව් සමාගම වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ණයගැති සමාගම වර්තමානයේදී කළමනාකරණය වන අතර එම මුදල නැවත අයකර ගැනීමේ හැකියාව වඩා ආරක්ෂිත වේ. | අත්තිකාරම් අයකර ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. |

දක්වා ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් විසින් ආපසු ගෙවා නොමැති අතර මෙම අත්තිකාරම් මුදල පියවීම සම්බන්ධයෙන් සමාගම ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සමාගම සමග ගිවිසුමකට එළඹී නොමැත. තව ද, සමාගම් රෙජිස්ට්‍රාර් වරයාගේ වාර්තාවලට අනුව, ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්හි මුළු කොටස් ප්‍රමාණය තවමත් මහා භාණ්ඩාගාරයට පවරා නොතිබූ අතර එය පුද්ගලයින් දෙදෙනෙකුට අයත් වේ. එබැවින් එම අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමේ හැකියාව සහ සමාගමට අයත් එවැනි වත්කමක පැවත්ම සම්බන්ධයෙන් විවේචනාත්මක සැකයක් විගණනය සතුව පවතී.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති පිළිබඳ සඳහන් රෙගුලාසි ආදිය | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i) මාර්ගෝපදේශ අංක 4.2.2 | මූල්‍ය හා භෞතික වශයෙන් වූ මාසික කාර්ය සාධන ප්‍රකාශ, මෙහෙයුම් ප්‍රකාශ, මුදල් ප්‍රවාහ ප්‍රකාශ, ද්‍රවශීලතා ප්‍රකාශ, ණය ගැනීම් සහ සේවක තනතුරු, නව බඳවා ගැනීම් ඇතුළුව මානව සම්පත් පිළිබඳ | 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 හි අංක 4.2.2 වගන්තියේ සඳහන් මාසික මූල්‍ය ප්‍රකාශන මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරනු ලබන ඕනෑම ඉදිරිපත් කිරීමක් සනාථ කිරීම සඳහා සියලු සාක්ෂි තබා ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාශ සෑම මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම සභාගත කර නොතිබුණි. | | |
| (ii) | මාර්ගෝපදේශ අංක 4.3 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා හට රැස්වීමෙන් දින 10 ක් ඇතුළත යැවිය යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | අදාළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා 2019 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (iii) | මාර්ගෝපදේශ අංක 5.1.1 | සමාගම වසර 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු අතර වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන සැලැස්මේ පිටපත් යාවත්කාලීන වාර්ෂික අයවැය සමඟ මූල්‍ය වර්ෂයේ ආරම්භයට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම අවශ්‍යතාවයට අනුකූල ව කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා වන එකී වාර්තා 2019 නොවැම්බර් 23 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර 2019 ජනවාරි 17 වන දින රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත යොමු කරන ලදී. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (iv) | මාර්ගෝපදේශ අංක 5.2.1 | ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් අයවැයට ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, එවැනි ක්‍රියාකාරී සැලැස්මක් සමාගම විසින් 2018 වර්ෂය සඳහා සකස් කර නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම 2018 අයවැයට ඇතුළත් කර නොතිබුණද, 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර එය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉදිරිපත් කර ඇත. | |
| (v) | මාර්ගෝපදේශ අංක 5.2.2 (ආ) | රුපියල් මිලියන 10 ඉක්මවූ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, සමාගම අවශ්‍යතාවයට අනුකූල ව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ නිර්දේශිත ප්‍රාග්ධන වියදම් ඇතුළු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අප විසින් පිළිපදිනු ලැබේ. මේ අනුව, මෙම කාණ්ඩය යටතේ ප්‍රාග්ධන වියදම් සඳහා වන අනුමැතිය අදාළ කමිටුවෙන් සුදුසු පරිදි ලබාගෙන ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (vi) | මාර්ගෝපදේශ අංක 9.2 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරය යටතේ අනුමත කාර්ය මණ්ඩලයක් සහිතව ලියාපදිංචි කර ඇති ඇති සංවිධාන ව්‍යුහයක් සමාගම සතුව නොපවතී. | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සමාගමේ වාර්ෂික අයවැයට සියලු නව කාර්ය මණ්ඩල වියදම්/ අයවැය ප්‍රතිපාදන ඇතුළත් කර ඇති බැවින් කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් මානව සම්පත් සම්බන්ධයෙන් නොමැත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (vii) | මාර්ගෝපදේශ අංක 9.3 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් සමාගම සතුව නොමැත. | සියළුම කාර්ය මණ්ඩල උසස්වීම් කාර්ය සාධන කළමනාකරණ යෝජනා ක්‍රමය මත පදනම්ව රේඛීය අධීක්ෂකවරුන් / ක්‍රියාකාරී ප්‍රධානීන් විසින් නිර්දේශ කර ඇති අතර කළමනාකරණ අධ්‍යක්ෂ විසින් අනුමත කර ඇත. මානව සම්පත් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් සමාගම සතුව නොමැත. කෙසේ වුවද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එවැනි සියලු වියදම් / | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අයවැය ප්‍රතිපාදන සමාගමේ වාර්ෂික අයවැයට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඇතුළත් කර ඇත. | |
| (viii) මාර්ගෝපදේශ අංක 9.7 | වැටුප් හා දීමනා අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටිය මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව සංශෝධනයකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, සමාගම මාර්ගෝපදේශයේ සඳහන් අවශ්‍යතාවයට අනුකූල වී නොමැත. | සියලුම කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා යෝජනා ක්‍රම සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබේ. මානව සම්පත් සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙතක් සමාගම සතුව නොමැත. කෙසේ වුවද, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව එවැනි සියලු වියදම් / අයවැය ප්‍රතිපාදන සමාගමේ වාර්ෂික අයවැයට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඇතුළත් කර ඇත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |
| (ආ) 2011 සැප්තැම්බර් 01 දිනැති අංක පීඊඩී/ 58 (2) දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ ඇති ආයතන වර්ගීකරණයන්ට අනුව ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම "එෆ්" කාණ්ඩයට අදාළ බව පෙනී යයි. ඒ අනුව මෙම උප කාණ්ඩය යටතේ ගැනෙන රජයේ ව්‍යාපාරවල ප්‍රධාන විධායක නිලධාරීන්ට දීමනා ගෙවීම සහ නියමයන් සහ කොන්දේසි අදාළ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊට සමාන ආයතනයන් භාවිතා කරනු ලබන තරඟකාරී වෙළඳපල අනුපාත සහ අදාළ පුද්ගලයාගේ අධ්‍යාපන | අදහස් දක්වා නොමැත. | සමාගම මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හා නිපුණතා මට්ටම සලකා බැලීමෙන් අනතුරුව ගරු. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය මත තීරණය කරනු ලැබේ. කෙසේ වුවද, වැටුප් තීරණය කිරීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය සමාගම විසින් ලබා ගෙන ඇති බව තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | | |
| (ඇ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනත | | | |
| (i) 41 (I) වගන්තිය | ඉකුත් විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති නමුත් විගණන හා කළමනාකරණ කමිටුවක් සමාගම විසින් මේ දක්වා ස්ථාපිත කර නොමැත. | නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූලව අප විසින් කටයුතු කර ඇති අතර 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 හි 7.4.1 වගන්තිය ප්‍රකාරව ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම සඳහා විගණන කමිටුවක් පිහිටුවීමට නිසි පියවර ගෙන තිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ සහ භාණ්ඩාගාර චක්‍රලේඛවල විධිවිධාන පිළිපැදිය යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,538,654,595 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 1,240,696,341 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 297,958,254ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාගමේ සාමාන්‍ය නිමැවුම් සහ මූල්‍ය ආදායම වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

විගණනයට ලද තොරතුරුවලට අනුව 2018 වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත පහත පරිදි වේ.

| | 2018 | 2017 |
|---|---|---|
| **ලාභදායිතා අනුපාත (ප්‍රතිශත)** | | |
| දළ ලාභ අනුපාතය | 83.98 | 82.75 |
| ශුද්ධ ලාභ අනුපාතය | 75.53 | 67.63 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 13.38 | 12.76 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | 15.82 | 14.62 |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)** | | |
| ජංගම වත්කම් අනුපාතය | 5.10 | 33.47 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 5.09 | 33.46 |

සමාගමේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 1.23 සහ සියයට 7.9 කින් ඉහළ ගොස් ඇත. තවද, පෙර වර්ෂයට සාපේක්ෂව වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සියයට 0.62 කින් සහ සියයට 1.2 කින් වැඩි වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් නිමැවුම් සහ මූල්‍ය ආදායම වැඩිවීම බලපා ඇත. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ද්‍රවශීලතා අනුපාතයන්හි 28.37 ක අඩු වීමක් පෙන්නුම් කෙරේ. වසර අවසානයේ ගෙවිය යුතු ලාභාංශ හේතුවෙන් ඇති වූ ජංගම වගකීම් වල සියයට 805.77 ක ඉහළ යාම මෙයට හේතුව ලෙස දැක්විය හැකිය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**3.1 අනාර්ථික ගනුදෙනු**

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ නව ව්‍යාපෘති සහ ව්‍යාප්ති සැලසුම් සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සහ සමාගම සම්බන්ධීකරණය කිරීම සඳහා සමාගම විසින් පුද්ගලයින් 04 දෙනෙකු 2015 සිට 2018 දක්වා කාලය තුළ අමාත්‍යාංශ සම්බන්ධීකාරක ලෙස රු. 900,000 ක පිරිවැයක් දරමින් බඳවා ගෙන ඇත.<br>කෙසේ වෙතත්, එවැනි කාල පරිච්ඡේදයක් තුළ ඔවුන් විසින් සම්බන්ධීකරණය කරන ලද කිසිදු ව්‍යාපෘතියක් විගණනයට නිරීක්ෂණය නොවුණි. | අදහස් දක්වා නොමැත. | සමාගම සිය රාජකාරිය ඉටු නොකළ නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර ඔවුන්ට ගෙවන ලද මුදල ආපසු අය කර ගත යුතුය. |

**3.2 ගිවිසුම් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විගණනයට ලද තොරතුරු වලට අනුව, සමාගමේ ගබඩා ටැංකි, නල මාර්ග සහ පොම්පාගාර භාවිතා කිරීම සඳහා ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් සමාගමෙන් ප්‍රතිදාන ගාස්තුවක් ලෙස මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 51 ක් අය කර තිබුණි. කෙසේ වුවද, විගණනයේදී ප්‍රතිදාන ගාස්තු අනුපාතය නියම කිරීමේ පදනම පැහැදිලි නොවුණි. ව්‍යාපාරයේ නියමයන් හා කොන්දේසි නියම කිරීම සඳහා සමාගම සිය එකම පාරිභෝගිකයා වන ලිට්රෝ ගෑස් ලංකා සමාගම සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි. | ප්‍රතිදාන සඳහා ෂෙල් ටර්මිනල් ලංකා (පුද්ගලික සමාගම) සමග (2001 ඔක්තෝබර් 31) අත්සන් කරන ලද ගිවිසුම විගණකවරුන්ට ලබා දී ඇත. | සමාගම ලිට්රෝ ගෑස් ලංකා සමාගම සමඟ පවතින ගිවිසුම යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) කම්කරුවන් සහ කාර්ය මණ්ඩල ප්‍රවාහනය ඇතුළු කොන්ත්‍රාත්තු යන බාහිර සේවා සඳහා සමාගම ගිවිසුම්වලට එළඹ නැත. | ආරක්ෂක සේවාව සඳහා ගිවිසුම් පවතින අතර ලිට්රෝ ගෑස් ලංකා සමාගම සහ ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම යන සමාගම් දෙකම එක ගිවිසුමකින් ආවරණය වේ. | සමාගම බාහිර සේවා කොන්ත්‍රාත්තු සඳහා ලිඛිත ගිවිසුම්වලට එළඹිය යුතුය. |